මාධ්‍ය විසින් දිවි තොර කර ගැනීම් සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම සඳහාත්, දිවි තොර කර ගැනීම් පැතිර යෑම මර්දනය කිරීම සඳහාත්, ඒ සම්බන්ධ ලිපි පළ කරනු දක්නට ලැබේ. කෙසේ නමුත්, මෙවැනි ලිපි සඳහාද දිවි තොර කර ගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් අදාළ වේ.

"හිත ගිනි ගත්තට සිරුරට ගිනි එපා" යන සිරස්තලය ඔස්සේ, ඉරිදා ලංකාදීප පුවත්පත (ජනවාරි 08, 2024) ඉදිරිපත් කර ඇති ඉහත ආකාරයේ ලිපියකි. මෙම ලිපියෙන් දිවි තොර කර ගැනීම් අධෛර්යමත් කළ යුත්තේ මන්ද යන්න සාකච්ඡා කරන අතරම, දිවි තොර කර ගැනීමේ හැඟීම් තිබේ නම් උපකාර ලබා ගැනීමට පෙළඹවීමක් ද ඇති කරයි.

එසේම මෙම ලිපිය සමඟින් විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකු විසින්, පිළිස්සුම් තුවාල ලැබූ රෝගීන්ගේ මානසික සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවන ලෙසින් මෙන්ම, ඔවුන්ට දෝෂාරෝපණය නොකරන ලෙසින්ද පැහැදිලි කර දෙන අදහස් ද අන්තර්ගත කර ඇත.

කෙසේ නමුත්, මෙම ලිපියෙන් උපුටා පහත දක්වා ඇති කොටසින්, දිවි තොර කර ගැනීමකට හේතුව සරල කොට දැක්වීමක් සහ, දිවි තොරකර ගැනීමක් සඳහා තැත් කළ අයට දෝෂාරෝපණය පැවරීමක් සිදු නොවන්නේදැයි අප ඇසිය යුතු වේ.

දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක්, සංකීර්ණ මනෝභාවයන් තිබිය හැක. එනිසාම, දිවි තොර කර ගැනීමක් වාර්තා කිරීමේදී, එයට හේතුව මෙයයැයි උපකල්පනය කිරීම හෝ හේතුවක් සරල කොට දැක්වීම නොකරන ලෙසට මාධ්‍ය මාර්ගෝපදේශයන් උපදෙස් දේ.

එසේම, දිවි තොරකර ගැනීමට උත්සාහ කළ අයට දෝෂාරෝපණය නොකරන ලෙසින් ද මාධ්‍ය මාර්ගෝපදේශයන් උපදෙස් ලබා දෙයි.

දිවි තොර කර ගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් අනුගමනය කිරීම, අනුකාරක සිදුවීම් වැළැක්වීමට මහෝපකාරී වනු ඇත.

හදිසි උපකාරක අංක:

* CCCline - 1333

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308

* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

